පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 06

# දෙවන වාර පරීක්ෂණය - 2019

# නර්තනය- I, II

පාසලේ නම : ..............................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ..............................................................

..............................................................

කාලය : පැය 2 යි.

## I – කොටස

❖ **1 සිට 20 දක්වා ප්‍රශ්න වලට අදාල පිළිතුර යටින් ඉරක් අදින්න.**

01. නමස්කාරයේ දී දෙවන වර වැඳීම සිදු කරනුයේ
    i. බුදුන්ට  ii. දෙවියන්ට
    iii. දෙමාපියන්ට  iv. පොළවට

02. උඩරට නර්තනයේ මැණ්ඩියේ සම්මත දුර ප්‍රමාණය වනුයේ,
    i. වියතයි.  ii. එක් වියත් තුනගුලයි.
    iii. විග්ගුස්සකි  iv . මිටි රියනකි

03. උඩරට නර්තනයේ පා සරඹ ගණන
    i. 24 කි  ii. 14 කි
    iii. 12 කි  iv . 16 කි

04. පහතරට ඉලංගම් සරඹ සබරගමුවේදී හැඳින්වෙන්නේ,
    i. දොඹින පද  ii. අත් සරඹ
    iii. ගොඩ සරඹ  iv . පා සරඹ

05. “ලත් පමණට මැටි ඉදිකරවාගෙන ...................................” මෙම කවි පදය
    i. ලී කෙළි කවි පදයකි  ii. කල ගෙඩි කවි පදයකි
    iii. කුළු කවි පදයකි  iv . තාලම් කවි පදයකි

06. “ගැටබෙරය, ටින් බෙරය, තාලම්පට” මෙම භාණ්ඩ අතරින් විකල්ප වාද්‍ය භාණ්ඩය වනුයේ,
    i. ගැටබෙරය  ii. තාලම්පට
    iii. ටින් බෙරය  iv . ඉහත කිසිවක් නොවේ.

07. තේවා හේවිසි සඳහා යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ වනුයේ
    i. දවුල, තම්මැට්ටම, හොරණෑව  ii. ගැටබෙරය, දවුල, තම්මැට්ටම
    iii. පහතරට බෙරය, ගැටබෙරය, දවුල  iv . හොරණෑව, ගැටබෙරය, පහතරට බෙරය

08. “ගාල්ල, මාතර, බෙන්තර,....” ආදී ප්‍රදේශවල ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය වනුයේ
    i. උඩරට නර්තන සම්ප්‍රදාය  ii. සබරගමු නර්තන සම්ප්‍රදාය
    iii. පහතරට නර්තන සම්ප්‍රදාය  iv . භරත නර්තන සම්ප්‍රදාය

09. සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන ඇඳුම් කට්ටලයන් වනුයේ
    i. තෙල්මේ හා වඩිග පටුන ඇඳුම් කට්ටල  ii. පබළු හා දෙවොල් ඇඳුම් කට්ටල
    iii. තෙල්මේ හා දෙවොල් ඇඳුම් කට්ටල  iv . වෙස් ඇඳුම් කට්ටලය හා නෛඅඩි ඇඳුම් කට්ටලය

Education NCP - www.edncp.lk

10. හනුමා වන්නමට අයත් බෙර පදය වන්නේ,

i. ජිං කඩ තක ජිං
ii. ජිං ගත කුද
iii. ජිං ගත ගො ගො
iv. කුද ගත ගත දොම්

11. "මතින් උඩඟු සිත ............................................" ඉතිරි පද කොටස වනුයේ,

i. පැතුම් විලස දූරුමා
ii. යෙකින් මෙලෙස ඉසි
iii. ලැගුම් සොයා පබුදමින්
iv. ගතින් වැඩිව පෙර

12. වෙසක් උත්සවය සමරන වෙනත් රටකි.

i. එංගලන්තය
ii. තායිලන්තය
iii. ඇමරිකාව
iv. ඉතියෝපියාව

13. "පාන්දරින් ඉස්කෝලෙට ........................" යන ගීතයේ පද රචනය කළේ

i. සෝමතිලක දිසානායක මහතා
ii. සුනිල් ආරියරත්න මහතා
iii. සුනිල් දයානන්ද මහතා
iv. ඩබ්.ඩී අමරදේව මහතා

14. තාලම්පටින් වාදනය කළ හැකි ශබ්ද ගණන

i. 3 කි
ii. 2 කි
iii. 5 කි
iv. 4 කි

15. සිංහල ගැමි නැටුම් වන කල, ලී වෙනුවට ද්‍රවිඩ සංස්කෘතික ජනයා ඉදිරිපත් කරන නර්තන අංගය වනුයේ,

i. සුලකු, කෝලාට්ටම්
ii. කොලාට්ටම්, කාවඩි
iii. වෙම්බු, කෝලාට්ටම්
iv. කාවඩි, සුලකු

- 16 සිට 20 දක්වා ගැලපෙන පිළිතුර යා කරන්න.

| | |
|---|---|
| 16. කුද ගත ගත දොම් | කස්තිරමකි |
| 17. තෙයි කිට තෙයි තාම් | නමස්කාර පදයකි |
| 18. තෙයියත් තෙයියත් තෙයියත් තාම් | ගොඩ සරඹයකි |
| 19. දොම් කිට කිට දොම් | පා සරඹයකි |
| 20. තජ්ජිත් තොං නං තා | බෙර පදයකි |

( ලකුණු 02 × 20 = 40 )

Education NCP - www.edncp.lk

## නර්තනය - II පත්‍රය

- **ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. i. සුළු තනි තිතට අයත් වන්නමක් නම් කරන්න. (ලකුණු 02)
 ii. එම වන්නමට අයත් කවියක් ලියන්න. (ලකුණු 05)
 iii. කලගෙඩි නර්තනයට අයත් කවි දෙකක් ලියන්න. (ලකුණු 05)

02. i. විකල්ප වාද්‍ය භාණ්ඩ යනු මොනවාද? (ලකුණු 02)
 ii. විකල්ප වාද්‍ය භාණ්ඩ තුනක් නම් කරන්න. (ලකුණු 05)
 iii. ඔබ කැමති සම්ප්‍රදායක වාද්‍ය භාණ්ඩයක් හා විකල්ප වාද්‍ය භාණ්ඩයක් ඇඳ දක්වන්න. (ලකුණු 05)

03. i. දේශීය නර්තන සම්ප්‍රදායන් තුන නම් කරන්න (ලකුණු 02)
 ii. ඔබ උගත් නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ දෙකක් හා ප්‍රධාන ඇඳුම් කට්ටලය ලියා දක්වන්න. (ලකුණු 05)
 iii. ඔබ කැමති නර්තන සම්ප්‍රදායක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05)

04. i. වෙසක් උත්සවය පැවැත්වීමේ අරමුණ ලියා දක්වන්න. (ලකුණු 02)
 ii. වෙසක් උත්සවය නිමිත්තෙන් ඉදිරිපත් කෙරෙන නර්තන ,ගායන පිළිබඳව කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 05)
 iii. වෙසක් උත්සව දිනයේ දක්නට ලැබෙන සැරසිල්ලක් ඇඳ දක්වන්න. (ලකුණු 05)

05. i. පාන්දරින් ඉස්කෝලෙට .... යන ගීතය ගායනා කරන ගායකයා නම් කරන්න. (ලකුණු 02)
 ii. එම ගීතයේ කොටසක් ලියන්න. (ලකුණු 05)
 iii. නැළවිලි කවි දෙකක් ලියන්න. (ලකුණු 05)

06. i. ද්‍රවිඩ සංස්කෘතියට අයත් ගැමි නැටුම් 2ක් නම් කරන්න. (ලකුණු 02)
 ii. ද්‍රවිඩ ගැමි නැටුම් වල සුවිශේෂී ලක්ෂණ 3ක් ලියන්න. (ලකුණු 05)
 iii. සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් අතර පවතින සමානතා හා අසමානතා ලියන්න. (ලකුණු 05)

07. i. ගුරු ගෙදර හා බැඳි චාරිත්‍ර දෙකක් ලියන්න. (ලකුණු 02)
 ii. පංති කාමරයේ දී නර්තනය හා බැඳි සාරධර්ම 04ක් ලියා දක්වන්න. (ලකුණු 04)
 iii. ගුරු වන්දනා කවියක් ලියා දක්වන්න. (ලකුණු 06)

Education NCP - www.edncp.lk
PAST PAPERS WIKI



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
GUIDE
PAST PAPERS
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
G.C.E. O/L
සිංහල
A9+
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
Knowledge Bank Publications
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440